# විවිධ දේව වරග

ඒකදේවවාදය බහුදේවවාදී සංස්කෘතියකට අවශෝෂණය කිරීමේ දී මුහුණ පාන ගැටලු කිහිපයක් අපි සාකච්ඡා කෙළෙමු. එහෙත් ඒ කිසිසේත් ම සම්පූර්ණ සාකච්ඡාවක් නොවන බව පැහැදිලි විය යුතු ය. බහුදේවවාදී සංස්කෘතියක නිර්මාපක දෙවියකු සිටිය හැකි ද යන්න එවැනි සාකාච්ඡාවක පැන නගින ප්‍රධාන ප්‍රශ්නයක් විය යුතු ය. නිර්මාපක දෙවියකු ඇත්නම් ඒ දෙවියන් අනෙකුත් දෙවියන්ගේ ද නිර්මාපකයා හෙවත් මැවුම්කරුවා විය යුතු ය. ඒ නිර්මාපක දෙවියන් සියලු දෙවියන් අතර ප්‍රධානියා වීම අනිවාර්ය නැතත් බොහෝ විට එවැන්නක් අපේක්‍ෂා කළ හැකි ය.

අනෙක් අතට නිර්මාපක දෙවි කෙනකු නැති වුව ද බහුදේවවාදී සංස්කෘතියක ප්‍රධාන දෙවියකුගේ පැවැත්ම ප්‍රශ්නයක් නො වේ. දඹදිව වෛදිකයන් පැමිණීමට පෙර ද තිබූ සංස්කෘතියෙහි ශක්‍ර දේවේන්ද්‍රයා ප්‍රධාන දෙවි විය. සක් දෙවිඳු සංකල්පය එයට පෙර වකවානුවක දඹදිවට ඉරානයෙන් (පර්සියාවෙන්) පැමිණියේ ද ප්‍රධාන දෙවියකුගේ පැවැත්ම දඹදිවට යක්‍ෂ සංස්කෘතියෙන් ලැබිණි ද ආදී ප්‍රශ්න මෙහි දී වැදගත් නො වේ. අපට වැදගත් වන්නේ ඒකදේවවාදයක් බහුදේවවාදී සංස්කෘතියකට අවශෝෂණය කෙරෙන්නේ කෙසේ ද යන්න ය.

සක් දෙවිඳු හෙවත් ශක්‍ර දේවේන්ද්‍ර යන වචනයෙහි ඉන්ද්‍ර යන පදයෙන් ගම්‍ය වන්නේ ප්‍රධානියා යන්න ය. බෞද්ධ සංස්කෘතියෙහි ද අපට සක් දෙවිඳු මුණ ගැසෙයි. ඉන්ද, ඉන්ද්‍ර, ඉඳු ආදී පදවලින් ගම්‍ය වන්නේ ප්‍රධානත්වය ය. එහෙත් බෞද්ධ සක් දෙවිඳු ලෝකය නිර්මාණය කළ තැනැත්තා නො වෙයි. ඔහු හුදෙක් දෙවියන් අතර ප්‍රධානියා වෙයි. බෞද්ධයනට සක් දෙවිඳු යන සංකල්පය පැරණි දඹදිව සංස්කෘතියෙන් ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය. බහුදේවවාදී සංස්කෘතියකට ඒකදේවවාදී සංස්කෘතියක් අවශෝෂණය කිරීම සාකච්ඡා කිරීමේ දී වැදගත් නොවුවත් ඉන්ද්‍ර හෙවත් ඉන්ද්‍රා නමින් හැඳින්වෙන දෙවියන් යක්‍ෂ ගෝත්‍රික සංකල්පයක් බව සැලකිල්ලට ගත යුතු ය.

යක්‍ෂ ගෝත්‍රිකයන් බහුදේවවාදී වූ අතර බොහෝ විට ඔවුන්ගේ දෙවියන් හැඳින්වීමේ දී යක්‍ෂයන් යන්න ද භාවිතා කෙරෙයි. ඉන්ද්‍ර යනු යක්‍ෂ ගෝත්‍රිකයන්ගේ ප්‍රධාන දෙවියන් වුව ද නැත ද ඔවුන්ට නිර්මාපක දෙවි කෙනෙක් නො වී ය. දඹදිවට ප්‍රධාන දෙවියකු ලබාදුන්නේ යක්‍ෂ ගෝත්‍රිකයන් විය හැකි ය. එසේ වුවත් ඒ දෙවියන් දඹදිව සංස්කෘතියට අවශෝෂණය කර ගැනීමේ දී එතරම් ගැටලු පැන නොනගින්නට ඇත. එයට හේතුව යක්‍ෂ ගෝත්‍රිකයන්ගේ දෙවියන් නිර්මාපක දෙවි කෙනකු නො වීම ය.

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම් ඇතැම් උගතුනට අනුව යක්‍ෂ යන්න යාඥා යන්නෙන් බිඳී ඇති බව ය. ඇතැම් විට යක්‍ෂ ගෝත්‍රිකයන් යාඥාව (යාගය) මුලින් ම දඹදිවට හඳුන්වා දුන්නා විය හැකි ය. පසුව ඉරානයෙන් හා බටහිර ආසියාවෙන් පැමිණි ආර්යයන් තව තවත් යාග දඹදිවට හඳුන්වා දී දඹදිව භාරතයක් බවට පත්කළ බව පෙනී යයි. එසේ දඹදිව භාරතය බවට පත්වීමේ දී  ආර්යයන්ගෙන් නිර්මාපක දෙවි කෙනකු ද ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය.

දඹදිව හා භාරතය අතර ඇති ප්‍රධාන වෙනසක් නම් දඹදිව ප්‍රධාන දෙවි කෙනකු සිටිය ද නිර්මාපක දෙවි කෙනකු නොමැති වීම හා භාරතයේ ප්‍රධාන දෙවි කෙනකු හා නිර්මාපක දෙවියකු වෙන වෙන ම සිටීම ය. ප්‍රධාන දෙවියකු ඇති බහුදේවවාදී සංස්කෘතියකට ඒකදේවවාදය අවශෝෂණය කර ගැනීමේ දී දඹදිව වැසියන් මුහුණ පෑ ප්‍රශ්නයක් එලෙස වෙන වෙන ම දෙවිවරුන් නිර්මාණය කිරීමෙන් (ලබා ගැනීමෙන්) විසඳා ගෙන ඇත. එහෙත් ඒ ගැටලුව විසඳා ගැනීමට ඇති එකම මග එය යැයි සැලකිය යුතු නො වේ.

ඒකදේවවාදී සංස්කෘතියක ඇත්තේ එක් දෙවියකු පමණ ය. ඒ දෙවියා බොහෝ විට නිර්මාපක දෙවියකු වේ යැයි සිතිය හැකි ය. එසේ නොවන්නට වෙනත් දෙවියන් ද බිහිකර ගැනීමට ඒ සංස්කෘතියට හැකි විය යුතු ය. (නිර්මාපක දෙවියන් ද බිහිකර ගනු ලබන්නේ සංස්කෘතියක් විසිනි. දෙවි කෙනකු ලෝකය හා මිනිසුන් ඇතුලු සත්වයන් නිර්මාණය කරනවා නොව සංස්කෘතියක් විසින් නිර්මාපක දෙවි කෙනකු බිහි කරගනු ලැබේ.) එවිට ඒ සංස්කෘතිය බහුදේවවාදී සංස්කෘතියක් බවට පත්වෙයි. නිර්මාපක දෙවි කෙනකු ඇති සංස්කෘතියක වෙනත් දෙවියන් නිර්මාණය කිරීමට ඇති ඉඩකඩ අඩු ය.

© Prof. Nalin De Silva

අප මෙතෙක් දෙවියන් ගැන කතා කළ නමුත් ඒ දෙවියන් ගැන එතරම් විශ්ලේෂණයක් නො කෙරිණි. දෙවියන් විවිධ වර්ගවලට අයත් බව පෙනී යයි. භාරතයේ ගින්න සුළඟ ආදිය ද දෙවියන් ලෙස සැලකිණි. එහි දී සිදු වී ඇත්තේ ගින්න සුළඟ ආදියට දේවත්ව ආරෝපණය කිරීම බව පැහැදිලි ය. පැරණි ග්‍රීක සංස්කෘතියෙහි ද එලෙස දේවත්ව ආරෝපණය කෙරිණි. ඒ අතර ඇතැම් සංස්කෘතීන්හි මියගිය ඇතැම් ඥාතීන් ඇතුලු පුද්ගලයන් මිය යෑමෙන් පසුව දෙවියන් බවට පත් වන්නේ යැයි විශ්වාස කෙරිණි. වෙනත් අයුරකින් කිවහොත් ඒ දෙවියන් ලෙස උපත ලැබීමකි. එවැනි සංකල්පයක් ඇති විය හැක්කේ සියල්ලන් හෝ ඇතැමකු හෝ මිය යෑමෙන් පසුව නැවත එක් වතාවක්වත් උපදින්නේ යැයි විශ්වාස කෙරෙන සංස්කෘතියක ය.

මේ අතර දිව්‍ය ලෝක ගැන විශ්වාස කෙරුණු සංස්කෘතීන් ද වෙයි. මනුෂ්‍යයන් හා වෙනත් මිහිපිට වෙසෙන සත්වයනට අමතරව වෙනත් ලෝකවල වසන දෙවියන් බ්‍රහ්මයන් ආදීන් ගැන බෞද්ධ සංස්කෘතියෙහි ද සඳහන් වෙයි. මේ වෙනත් ලෝක යනු ග්‍රහ ලෝක නො වේ. භූමාටු දෙවියෝ පොළොව ආසන්නයෙහි ම ජීවත් වෙති. රුක් දෙවියන්ගේ වාසස්ථාන සහිත ලෝකය ඇත්තේ ගස්වල ය. එයට අමතර ව තුසිත දෙව් ලොව ආදී දිව්‍ය ලෝක ද වෙයි. මේ ලෝක එකක් වත් ග්‍රහ ලෝක වීම අනිවාර්ය නො වේ. ලෝකයක් යනු යම් පිරිසකගේ එකතුවක් මිස පෘථිවිය වැනි වස්තුවක් නො වේ.

අප මනුෂ්‍ය ලෝකය යනුවෙන් අදහස් කරන්නේ මිනිසුන්ගේ එකතුවකි. මිනිස් ලෝකය පෘථිවියෙහි හෙවත් මේ ග්‍රහ ලෝකයෙහි පැවතීම හේතුකොටගෙන අපට ප්‍රේත ලෝක දිව්‍ය ලෝක ආදිය ද එලෙස පවතින පඨවි ධාතුව සහිත ලෝක ලෙස සිතීමට පුරුදු කෙරී ඇත. එහෙත් තිරිසන් ලෝකය ද මනුෂ්‍ය ලෝකය ලෙස ම මේ මිහිපිට පවත්නා තවත් ලෝකයක් බව අපට අමතක වෙයි. එකම පෘථිවියෙහි ලෝක ගණනාවක් පැවතීමට හැකි ය.

අනෙක් අතට වෙනත් ග්‍රහ ලෝකවල සත්වයන් ඇති බව පිළිගැනීම බටහිරයන්ට මහත් ගැටලුවක් වුවත් බෞද්ධයනට එය කිසිසේත්ම ප්‍රශ්නයක් නො වේ. මනුෂ්‍යයන් ඇතුළු සත්වයන් පෘථිවියට පමණක් සීමාකිරීමට බෞද්ධයෝ නො පෙළඹෙති. ඒ කුමක් වුවත් මිනිසුන් විසින් මිය යෑමෙන් පසුව දේවත්වයෙන් පුදනු ලබන පිරිස්, මෙලොවින් චුත වී දිව්‍ය ලෝකවල උත්පත්තිය ලබන මිනිසුන් ඇතුළු සත්වයන් අපට එක් දේව කොට්ඨාශයකට අයත් කළ හැකි ය. මේ දෙවියන් දිව්‍ය ලෝකවල උපදින්නේ කිනම් අන්දමක වුවත් සසර ගමනෙහි යෙදෙමින් ය.

මිනිස් ලොවින් හෝ වෙනත් සත්ව ලෝකයකින් හෝ චුත වී දිව්‍ය ලෝකවල ඉපදෙන්නන් පසුව එයින් ද චුත වී නැවත මිනිස් ලෝකයෙහි හෝ සත්ව ලෝකයක හෝ ඉපදිය හැකි ය. ඒ අයුරින් දිව්‍ය ලෝකවල ඉපදෙන්නෝ සසර ගමනෙහි එක් අවස්ථාවක දෙවියෝ වෙති. මේ දෙවිවරුන් බොහෝ මිනිසුනට නො පෙණුන ද ඔවුන් දැක ඇති මිනිස්සු ද වෙති. අපේ පන්සල්වල ඇති දේව රූප සියල්ල පාහේ එකම හැඩයක් ගන්නේ පළමුව දෙවියන් ඇඳි චිත්‍ර ශිල්පියා අනුකරණය කරමින් අනෙක් චිත්‍ර ශිල්පීන් ද දේව රූප අඳින නිසා නොව දෙවියන් දකින අය දැක ඇති දෙවියන් එලෙස සැරසී සිටින නිසා ය. දෙවියන් ඇඳීම චිත්‍ර ශිල්පීන්ගේ අභිමතයට සිදුවන්නේ නම් වෙනත් වෙනත් ආකාරයේ දේව රූප නිර්මාණය විය යුතු යැයි සිතමි.

සංසාර ගමනෙහි තාවකාලික ව දේව භව ලබන්නවුන්ට ද ලැබෙන නාමය දෙවියන් යන්න ය. මේ දෙවියන්ට අමතර ව අප කලින් සඳහන් කළ පරිදි දේවත්ව ආරෝපණය කරනු ලැබූ වස්තු වෙති. ගින්න, සුළඟ, ආදී මේ වස්තු සංසාර ගමනෙහි යෙදෙන දෙවියෝ නො වෙති. ඒ දෙවිවරු ඒ භවයන් අත් නො හරති. බෞද්ධයනට කිසිවක් සදාකාලික නොවෙතත් මේ දෙවියන්ට ඒ ඒ සංස්කෘතීන්හි එක්තරා ආකාරයක සදාකාලික බවක් ඇත. මේ දෙවියන් ජීවීන් වන්නේ දේවත්ව ආරෝපණය කෙරී ඇති බැවින් මිස ඔවුන් ජීවීන් වූ නිසා නො වේ.

මෙයට අමතරව තවත් ආකාරයක දෙවිවරු වෛදික සංස්කෘතියෙහි දැක ගත හැකි ය. නුවණට අධිපති ගණ දෙවියන්, කලාවට අධිපති සරස්වතී දෙවඟන ආදී වශයෙන් ඒ ඒ ගුණයට අධිපති දෙවිවරු වෙති. එහි දී ද සිදුවන්නේ දේවත්ව ආරෝපණයකි. කලින් සඳහන් කළ දෙවියන් වස්තුවලට දේවත්ව ආරෝපණය කිරීමෙන් ලැබෙන අතර මේ ගණයේ දෙවිවරුන් ගුණවලට දේවත්ව ආරෝපණයෙන් ලැබෙයි.

මේ හැරෙන්නට වෙනත් දේව වර්ග ද තිබිය හැකි ය. විවිධ සංස්කෘතීන්හි විවිධ දේව වර්ග නිර්මාණය වන්නට ඇති ඉඩකඩ අධික ය. අපි දැනට ඒ දේව වර්ග නොසළකා මෙහි සඳහන් දේව වර්ග තුන ගැන පමණක් අවධානය යොමු කරමු. අවශ්‍ය නම් කෙනකුට දේව වර්ග තුනක් වෙනුවට දේව වර්ග දෙකක් පමණක් සැලකිය හැකි ය. ඒ වස්තුවලට හා ගුණවලට දේවත්වය ආරෝපණය කිරීමෙන් ලැබෙන දේව වර්ග එකක් ලෙස

© Prof. Nalin De Silva

සැලකීමෙනි. මෙහි පසුව සඳහන් කෙරුණු දේව වර්ග දෙක හෝ තුන හෝ බෞද්ධයන් තම සංස්කෘතියට අවශෝෂණය කර ඇත්තේ ඒ දෙවියන් සදාකාලික බවින් මුදා තාවකාලික දෙවියන් බවට පත්කිරීමෙන් හා ඉන් ඇතැම් දෙවියන් බෝසතුන් වහන්සේලා බවට පත්කර ගැනීමෙනි.

අප බහුදේවවාදී සංස්කෘතීන් ලෙස සලකන්නේ සංසාර ගමනෙහි තාවකාලික දිව්‍ය සම්පත් විඳින පළමු ගණයේ දෙවියන් ගැන විශ්වාසයක් ඇති සංස්කෘතීන් නො වේ. බහුදේවවාදී සංස්කෘතීන් ලෙස ගැනෙන්නේ දෙවැනි හා තුන්වැනි ගණවල (අවශ්‍ය නම් ඒ දෙකම එකම ගණයක ලා සැලකෙන) දෙවියන් නිර්මාණය කෙරී ඇති සංස්කෘතීන් ය. දෙවැනි ගණයේ හෝ තුන්වැනි ගණයේ හෝ දෙවියෝ තාවකාලිකව දිව්‍ය ලෝකවල උපන්නවුන් නොව ඊනියා නිත්‍ය (බෞද්ධ සංකල්පයක් විය නොහැකි බව පැහැදිලි ය.) වූ දෙවියෝ වෙති. මෙවැනි දෙවියන් එක් අයකුට වඩා ඇති හෙයින් එවැනි සංස්කෘතියක් බහුදේව සංස්කෘතියක් වෙයි. මේ එක් දෙවියකුවත් ලෝකය නිර්මාණය කළ (මැවූ) දෙවි කෙනකු නොවීම මෙහි දී කැපී පෙනෙන ලක්‍ෂණයක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva